# ***රාජ්‍ය සේවයේ වැටුප්,වේතන හා අනෙකුත් පාරිශ්‍රමිකයන් සමාලෝචනය කර සියළුම රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රතිසංස්කරණය සඳහා වූ විශේෂඥ කමිටුව විසින් සකස් කළ "අතුරු වාර්තාව"***

**පසුබිම**

මිලියන 1.3 වැඩි රාජ්‍ය සේවකයින් විසින් මිලියන 22ක් වන ජනතාවට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු මෙන්ම සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හරහා පුළුල් පරාසයක් තුළ සේවා සපයයි.

රාජ්‍ය සේවයේ වැටුප් වෙනුවෙන් දළ වශයෙන් වසරකට රුපියල් බිලියන 1200කට අධික මුදලක් වැටුප් හා දීමනා සඳහා වැය කරන අතර, එයට අමතර වශයෙන් විශ්‍රාම වැටුප් වෙනුවෙන් තවත් රුපියල් බිලියන 400ක් රජය විසින් වැය කරනු ලබයි.

දීර්ඝ කාලයක් තිස්සේ මූලික වැටුප් වැඩි නොකළ බවට රාජ්‍ය සේවයේ වෘත්තීය සමිති මඟින් විවිධ ඉල්ලීම් සිදුකරමින් සිටින අතර, එම ඉල්ලීම් සලකා රටට අවම වැය බරක් සිදුවන අයුරින් සමස්ත රාජ්‍ය සේවය ම ආවරණය වන පරිදි, සමස්ත රාජ්‍ය සේවයේ ම වැටුප් හා දීමනා සමාලෝචනය කොට පවතින ආර්ථික නිර්ණායක වලට අනුකූලව ආකර්ශනීය වැටුප් ක්‍රම හා දීමනා ක්‍රම හඳුන්වා දෙමින් ඵලදායී, ගුණාත්මක සහ කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇති කිරීම සඳහා අවශ්‍ය යෝජනා ඉදිරි වසරේ අයවැය සඳහා ඉදිරිපත් කිරීම කාලීන අවශ්‍යතාවයකි.

රජයට සිදුවන වැය බර අවම කරමින් වැටුප් හා දීමනා කාලානුරූපීව ඉහළ දැමීම මෙන්ම අදායම් උත්පාදන නව්‍ය ව්‍යාපෘති හඳුනාගැනීම ද ඒ හා සමගාමීව ඉටුකළ යුතුම වන අතර, එමඟින් භාණ්ඩාගාරයට දැරීමට සිදු වන අමතර වැය බර අඩු වනු ඇති බවට ද කමිටුව විසින් සුවිශේෂීව හඳුනාගෙන ඇත.

අමාත්‍ය මණ්ඩලය විසින් 2024 මැයි මස 27 වන දින අනුමැතිය ලබා දී ඇති අංක 24/විවිධ (020) දරණ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, රාජ්‍ය සේවයේ විවිධ සේවක කණ්ඩායම් අතර පැවති වැටුප් විෂමතාවන් පිළිබඳව අධ්‍යයනය කර, 2025 වර්ෂය සඳහා වන අයවැය යෝජනාවලට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට හැකිවන පරිදි රාජ්‍ය සේවයේ සියලුම අංශයන්හි වැටුප්, වේතන හා අනෙකුත් පාරිශ්‍රමිකයන් සමාලෝචනය කර සිදු කළ යුතු සංශෝධන සම්බන්ධයෙන් වන නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත්කළ විශේෂඥ කමිටුව විසින් රාජ්‍ය අංශයේ ප්‍රධාන වෘත්තීය සංගම් 91ක් සහ රාජ්‍ය නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වමින් සිටී.

එසේම, විද්‍යුත් මාධ්‍ය සහ මුද්‍රිත මාධ්‍ය හරහා කමිටුව විසින් සිදුකරන ලද ඉල්ලීම් පරිදි වෘත්තීය සංගම්, විවිධ සංවිධාන, ආයතන හා පුද්ගලයින් 371 දෙනෙකුගෙන් පමණ යෝජනා ඉදිරිපත්වී ඇති අතර, එම තොරතුරු හා යෝජනා ද ක්‍රමානුකූලව විශ්ලේෂණය කරමින් පවතී.

ඒ අනුව, පහත සඳහන් නිර්ණායක හා උපමානයන් පාදක කර ගනිමින් විවිධ සේවා කාණ්ඩ අතර වැටුප් හා දීමනා වල පවතින විෂමතා අවම කිරීම මඟින් රාජ්‍ය සේවකයන්ගේ ගුණාත්මක, කාර්යක්ෂම හා ඵලදායී සේවා සැපයීම ඉහළ යාමෙන් රටේ ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම සිදුවනු ඇති බවට ද කමිටුව දැඩිසේ විශ්වාස කරයි.

ඒ අනුව, රාජ්‍ය සේවකයින් හට තෘප්තිමත් රාජ්‍ය සේවයක් ඉටුකරලීම සඳහා පවතින ආර්ථිකය තුළ රජයට දරාගත හැකිවන ලෙස සේවක වැටුප් හා අනෙකුත් දීමනා ලබාදීමට හැකිවන පරිදි වැටුප් ප්‍රතිව්‍යුහගත කිරීමේ රාමුවක් එළඹෙන 2025 වසර සඳහා වූ අයවැය යෝජනා සකස් කිරීමේ දී පහත සඳහන් මූලික කරුණු අනුව සලකා බැලීම සුදුසු බව කමිටුව නිර්දේශ කෙරේ.

1. සමස්ත රාජ්‍ය සේවයේ සියළුම තනතුරු, ප්‍රධාන සේවා මට්ටම් හතරක් (04) යටතේ වර්ගීකරණය කර, ඒ එක් එක් කාණ්ඩය, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) හා ජාතික වෘත්තීය නිපුනතාව(NVQ) පදනම්කර ගනිමින් හා අදාළ රැකියා කාර්යභාරය, වගකීම් හා විශේෂ රැකියා සඳහා නිපුනතාවයකින් යුත් සේවකයින් ආකර්ෂණය කරගැනීම හා රැකියාවන්හි රඳවා ගැනිම සැළකිල්ලට ගෙන බඳවා ගැනීමේ සුදුසුකම් අනුකාණ්ඩවලට වර්ගීකරණය කිරීම.
2. ප්‍රාථමික සේවා කාණ්ඩ සඳහා ද බඳවා ගැනීමේ මූලික සුදුසුකම් ලෙස ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) ජාතික වෘත්තීය නිපුනතාව (NVQ) පදනම්ව සේවා අවශ්‍යතාව පරිදි සුදුසු තෝරාගැනීමේ ක්‍රමවේද අනුගමනය කිරිම.

3. අන් සියළුම සේවා කාණ්ඩ සඳහා විධිමත් තරඟ විභාග හා සම්මුඛ පරීක්ෂණ ක්‍රම මඟින් පමණක් බඳවා ගැනීම් සිදුකිරීම.

4. ඒ අනුව සුදුසු පරිදි දැනට අනුමත බඳවා ගැනීමේ පටිපාටි කඩිනමින් සංශෝධනය කිරීම.

5. 2025 පාදක වසර ලෙස සලකා සියළුම රජයේ සේවකයින් සඳහා (සෑම වසර තුනකට වරක් සංශෝධනය කිරීමට යටත්ව) ජීවන වියදම් දීමනාව Cost of Living (COL) මාසිකව රුපියල් 25,000ක් ගෙවීම.

6. රාජ්‍ය සේවයේ අවම ආරම්භක මාසික වැටුප 24% ක අවම ප්‍රතිශතයකින් වැඩිකොට කොට ජීවන වියදම් දීමනාව සමඟ දළ වැටුප රු. 55,000 ක් ලෙස ගෙන අනෙකුත් සියළුම තනතුරු සඳහා මූලික වැටුප ඒ අනුව ගැලපීම.

7. ව්‍යාපාරික රාජ්‍ය සමාගම් හා බැංකු හැර අන් සියළුම රාජ්‍ය ආයතන සඳහා මෙම නව වැටුප් හා දීමනා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරිම.

8. ඒ අනුව 2025 සිට වසර 03ක් ඇතුලත සමස්ත රාජ්‍ය සේවයේ හැකි සෑම ක්ෂේත්‍රයක් තුළම ඩිජිටල්කරණය (Digitalization) හා ස්වයංක්‍රීයකරණය (Automation) තුළින් ඉලෙක්ට්‍රොනික පද්ධති මඟින් රාජ්‍ය පාලනය සඳහා ක්‍රමවේදයක් (E - Governance) හඳුන්වාදීම සහ ඒ සඳහා රාජ්‍ය ආයෝජනයේ ප්‍රමුඛතාවය ලබාදීම.

9. රාජ්‍ය අංශයේ සියලුම සේවකයින් හා විශ්‍රාමිකයින් ද ඇතුළත්ව මාසිකව අවම රුපියල් 1000.00 ක දායකත්වයක් සහිතව වඩාත් ආකර්ශණීය ප්‍රතිලාභ හිමිවන පරිදි වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් 2025 ජනවාරි සිට ක්‍රියාත්මක කිරීම.

10. හැකි සෑම අවස්ථාවක ම බාහිර සේවා වැනි ක්‍රමවේද (Outsourcing) මඟින් රජයේ වැය බර අවම වන ලෙස සහ කාර්යක්ෂමතාවය උපරිම වන ලෙස නියමිත ක්‍රමවේදය අනුගමනය කරමින් සේවා ලබාගැනීම.

11. හඳුනාගත් රාජ්‍ය දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත ආයතන, කොටස් වෙළඳපලේ ලැයිස්තුගත සීමිත පොදු සමාගම් (Public Liability Company - PLC) බවට පත්කිරීමේ ප්‍රතිව්‍යුහකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.(රාජ්‍ය,පෞද්ගලික ආයෝජන,මහජනයා සහ, සේවකයින් සඳහා කොටස් දායකත්ව සහිතව)

12. නිසි වැඩ අධ්‍යයනයක් (Work study) සිදු කොට සමස්ථ රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩලවල හා සේවා පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරිම සඳහා 2025 වසර තුළ කටයුතු කිරිම.

13. 2030 වන විට රාජ්‍ය සේවයේ සමස්ත සේවක මණ්ඩලය දශලක්ෂයට (1,000,000.00) හෝ ඊට අඩු මට්ටමක් දක්වා සීමා කර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම.

14. ඒ අනුව සියළුම රාජ්‍ය සේවකයින් සඳහා කාර්ය සාධක දර්ශක (KPI) සකස් කොට එහි ප්‍රගතිය පදනම් කරගනිමින් වැටුප් වර්ධක ලබාදීම.

15. නිදහස් සෞඛ්‍ය හා නිදහස් උසස් අධ්‍යාපනය වඩාත් සුරක්ෂිත හා ගුණාත්මක ලෙස ආරක්ෂාකර ගනිමින්, එම ක්ෂේත්‍රයන්හි ඇති භෞතික හා මානව සම්පත්,විශ්වාසනීයත්වය හා පිළිගැනීම සහිත ක්ෂේත්‍ර පදනම් කරගනිමින් ආර්ථික වටිනාකම් ඇති සේවාවක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරිම.

16. 2020 වසරට පෙර විශ්‍රාම ගත් රාජ්‍ය නිළධාරින් හට හිමිකම් ලැබූ වැටුප් වර්ධක ලබාදී ඔවුන්ගේ විශ්‍රාම වැටුප සංශෝධනය කර අදාල විෂමතා නිරවුල් කිරිම.

17. විශ්‍රාමිකයින් සඳහා ජීවන වියදම් දීමනාව, සක්‍රීය සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන් සඳහා ලබා දෙන ජීවන වියදම් දීමනාවෙන් 50% කට සමාන වන පරිදි 2025 ජනවාරි සිට ලබා දීම.

18. දැනට පවතින බදු ප්‍රතිපත්තිය තුළම මෙම වියදම් කළමණාකරණය කිරිමට යටත්ව මෙම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ යෝජිත වැටුප් ක්‍රමය 2025 ජනවාරි මස 01 දින සිට රාජ්‍ය මූල්‍ය අවකාශය ද සැළකිල්ලට ගෙන අදියරගතව ක්‍රියාත්මක කිරීම.

| | | |
|---|---|---|
| 1. | උදය ආර්. සෙනවිරත්න<br>හිටපු ජනාධිපති ලේකම් | කමිටු සභාපති |
| 2. | ජී.එල්. වර්ණන් පෙරේරා<br>ජනාධිපති අතිරේක ලේකම්,<br>ජනාධිපති කාර්යාලය | කමිටු ලේකම් |
| 3. | ජුඩ් නිලුක්ෂාන්<br>අධ්‍යක්ෂ ජනරාල්,<br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව | කමිටු සාමාජික |
| 4. | හිරන්සා කලුතන්ත්‍රි<br>අධ්‍යක්ෂ ජනරාල්,<br>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | කමිටු සාමාජික |

5. එස්. ආලෝක බණ්ඩාර — කමිටු සාමාජික
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

6. එච්.ඒ. චන්දන කුමාරසිංහ — කමිටු සාමාජික
ආයතන අධ්‍යක්ෂ ජනරාල්

7. වෛද්‍ය ටෙරන්ස් ගාමිණී ද සිල්වා — කමිටු සාමාජික
විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
සෞඛ්‍ය අමාත්‍යාංශය

8. දුමින්ද හුලංගමුව — කමිටු සාමාජික
සභාපති, ලංකා වාණිජ මණ්ඩලය

9. චන්දි එච්. ධර්මරත්න — කමිටු සාමාජික
Chief People Officer,
BCS International Technology PTY LTD

10. ඉසුරු තිලකවර්ධන — කමිටු සාමාජික
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ,
කොමර්ෂල් බැංකුව